# 多言語情報コーナー　　　　　　（令和８年　２月号）

## 1. වතරසේ ගංවතුර පාලන ද්‍රෝණියේ බට පුළුස්සා දැමීමේ උත්සවය පිලිබඳව

ෆුජියෝකා නගරයේ වතරසේ ගංවතුර පාලන ඉවුරු දෙපස ඇති , බට වගාවන් මගින් පරිසරය ආරක්ෂා කිරීම , පළිබෝධකයන් තුරන් කිරීම සහ ගිනිගැනීම් වලක්වා ගැනීමේ අරමුණින් වතරසේ ගංවතුර පාලන ද්‍රෝණි ප්‍රදේශය පුරාම වැඩෙන තණකොළ පවුලක් වන බට පුළුස්සා දැමීමේ උත්සවයක් පවත්වනු ලැබේ. මෙහිදී විවෘර්ත භූමියකදී වියලිගිය බට පුළුස්සා දැමීම මගින් වසන්ත කාලයේදී වැවෙන විවිධ ශාක අංකුර සැදීම සඳහා සහයෝගය ලබාදීම මෙම සම්ප්‍රදායික උත්සවයේ අරමුණ වේ.

මෙම වසරේ උත්සවය මාර්තු 7 වන සෙනසුරාදා පෙ.ව. 8:30 සිට පැවැත්වේ. වර්ෂාව හෝ වෙනත් හේතූන් මත එදින උත්සවය පැවැත්වීමට හැකියාවක් නොමැති නම්, එය මාර්තු 8, 14 හෝ 15 දක්වා කල් දමනු ලැබේ.

අහස අඳුරු වනු ඇති අතර, සුළඟේ දිශාව අනුව, අළු දුර ප්‍රදේශවලට ද යා හැකිය.මෙම අළු උද්‍යාන, වහලවල් සහ බැල්කනිවල ද වැටී එකතු විය හැකි අතර එබැවින් රෙදි වේලීම නිවාස ඇතුලත සිදු කිරීමත් සහ ඔබගේ මෝටර් රථ ආරක්ෂිත වහලයක් ඇති ස්ථානයක තබා ගැනීමෙන් අපට ඔබගේ සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමු.

## 2. තොච්ගි බදු කාර්යාලයෙන් දැනුම්දීම: "වසර අවසාන බදු ගොනු කිරීමේ ස්ථානය පිළිබඳව "

2025 බදු වර්ෂය සඳහා බදු ගොනු කිරීමේ ස්ථානයේ කාලය වන්නේ පෙබරවාරි 16 වැනිදා සිට මාර්තු 16 දක්වා වේ.පවත්වන ස්ථානය ලෙස කතයානගි නගරයේ හි ඇති තොච්ගි වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ ප්‍රධාන ශාලාවයි.
මෙය පෙරවරු 8:30 සිට පස්වරු 4:00 දක්වා පැවැත් වේ. උපදේශන සඳහා පෙරවරු 9:00 සිට ආරම්භ වේ.

බදු ප්‍රතිලාභ ගොනු කිරීමේ ස්ථානයට ඇතුළු වීමට අංකිත ටිකට් පතක් අවශ්‍ය වේ. ජාතික බදු ඒජන්සියේ නිල LINE ගිණුම හරහා අංකිත ටිකට්පත් කල්තියා වෙන් කරවා ගත යුතුය.

හැකි නම්, කරුණාකර ඔබගේ මයි නම්බර් කාඩ්පත භාවිතා කර නිවසේ සිට 2025 සඳහා ඔබේ බදු ප්‍රතිලාභය ගොනු කිරීමට "e-Tax" භාවිතා කල හැකිය. ඔබ "e-Tax" භාවිතා කරන්නේ නම්, ඔබට බදු ප්‍රතිලාභ ගොනු කිරීමේ ස්ථානයකට පැමිණීමට හෝ බදු ප්‍රතිලාභ සම්බන්ධ කිසිදු ලේඛනයක් ගෙන ඒමට හෝ තැපැල් කිරීමට අවශ්‍ය නොවේ. නිවාඩු දින ඇතුළුව පැය 24 පුරාම ඒ හා සම්බන්ද විය හැකි අතර, ඔබට ඔබේම නිවසේ සිට පහසු ඕනෑම වේලාවක මාර්ගගතව ගොනු කළ හැකි බැවින් එය අතිශයින්ම පහසු වනු ඇත.

### 3. නොරෝ වයිරසය නිසා ඇතිවන බෝවන ආමාශයේ අසාදනවලින් පරිස්සම් වන්න!

නොරෝ වයිරස ආසාදන මගින් ඇතිවන ආමාශයේ ආසාදන සහ ආහාර විෂ වීම් විශේෂයෙන් ශීත ඍතුවේ දී බහුලව දක්නට ලැබේ. නොරෝ වයිරසය සඳහා එන්නතක් හෝ විශේෂයෙන් ඵලදායී ඖෂධයක් නොමැත. ප්‍රතිකාර මගින් ක්ෂණිකවම රෝග සමනය කල නොහැකි බැවින් ඔබේ අත් සේදීම සහ විෂබීජ නාශක භාවිතා කිරීම මගින් මෙවැනි රෝග වෛරස වලින් වැළකිය හැක.

නොරෝ වයිරසය බොහෝ විට අත් ඇඟිලි හෝ ආහාර මගින් මුඛය හරහා ශරීරගත වීමෙන් ආසාදනය වීම සිදුවන අතර ප්‍රධාන වශයෙන් රෝග ලක්ෂණ වන්නේ වමනය, පාචනය සහ උණ වැනි රෝග ලක්ෂණ වේ.බොහෝ විට දින 1ත් 2 ත් ඇතුළත මෙම රෝග ලක්ෂණ පෙන්නුම් කරනු ලැබේ.ඇතැම් විට ඔබ රෝග ලක්ෂණ නොපෙන්වුවද, ඔබ ආසාදනය වූ පසු, නොරෝ වයිරසය ඔබේ මළ අපද්‍රව්‍ය සමග බැහැර වනු ඇත. එබැවින් ඔබ නොදැනුවත්වම මෙම වයිරසය අනෙක් පුද්ගලයින්ට සම්ප්‍රේෂණය වීමේ හැකියාවක් ඇත. සෞඛ්‍ය සම්පන්න පුද්ගලයින් බොහෝ විට මෘදු රෝග ලක්ෂණ ඇතිවී සුවය ලබන පුදලයින්ද බොහෝ ප්‍රමාණයක් සිටිය හැක.නමුත් ළමයින් සහ වැඩිහිටියන්ට දරුණු රෝග ලක්ෂණ ඇති විය හැක, එබැවින් කරුණාකර ප්‍රවේශම් වන්න.

අසාදන වැළැක්වීමේ පියවර අතරට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

1. සබන් යොදා හොඳින් ඔබේ අත් නිතර සෝදන්න.

2. ඉවුම් පිහුම් උපකරණ සේදීමෙන් පසු, සෝඩියම් හයිපොක්ලෝරයිට් ද්‍රාවණයක හෝ ජලය සමග තනුක කළ ගෘහස්ථ ක්ලෝරීන් බ්ලීච් එකක අවම වශයෙන් මිනිත්තු පහක් ගිලවා තබන්න.

3. කෑමට පෙර බෙල්ලන් වැනි දෑ හොඳින් පිස ආහාරයට ගන්න.

4. පාචනය හෝ වමනය වැනි රෝග ලක්ෂණ ඇත්නම්, ආහාර ඍජුව ඇල්ලීමෙන් වැලකීම.

5. ආසාදන ප්‍රභවයක් වීමට වැඩි ඉඩ ඇති වැසිකිළි, ඒවා සනීපාරක්ෂාව සඳහා පිරිසිදු කර විෂබීජහරණය කළ යුතුය.